# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2387/22 – 2024 ජුනි මස 05 වැනි බදාදා – 2024.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/1981 (ii)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

24ඈ වන වගන්තිය සහ 24ඇ වන වගන්තිය යටතේ වූ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24ඈ වන වගන්තිය සහ 24ඇ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මේ නියමය මගින්

(අ) මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති ඉම් සලකුණු හා සීමා තුළ පිහිටි භූමි ප්‍රදේශය, පනතේ කාර්ය සඳහා පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් විය යුතු බවටත් (මෙහි මින්මතු “ආරක්ෂක ප්‍රදේශය” යනුවෙන් සඳහන් කරනු ලබන) එම භූමි ප්‍රදේශය “වර්ණගලවත්ත පාරිසරික ආරක්ෂක ප්‍රදේශය” යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත්;

(ආ) මේ නියමය බලාත්මකව පවතින තාක්කල් -

(i) ඉහත කී පනතේ විධිවිධාන සමඟ ගැටෙන්නා වූ ආරක්ෂක ප්‍රදේශය තුළ වූ යම් සැලසුම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක්, මේ නියමය ක්‍රියාත්මක වන දිනයේ සිට ක්‍රියාත්මක වීම නතර විය යුතු බවටත්;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) අධිකාරිය නොවන කිසිම තැනැත්තෙකු විසින්, ආරක්ෂක ප්‍රදේශය ඇතුළත යම් සැලසුම් සම්පාදනයට සහ සංවර්ධනයට අදාළ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම නොකළ යුතු බවටත්;

එසේ වුව ද, අධිකාරිය විසින් ආරක්ෂක ප්‍රදේශය ඇතුළත සැලසුම් සම්පාදනට සහ සංවර්ධනයට අදාළ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය වලින් කිසිවක්, 26 වන වගන්තියේ විධිවිධාන යටතේ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, පළාත් පාලන ආයතනයකට හෝ යම් රජයේ නිලධරයකුට පවරනු ලබන අවස්ථාවක, එම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව, සංස්ථාව, ව්‍යවස්ථාපිත මණ්ඩලය, පළාත් පාලන ආයතනය හෝ රජයේ නිලධරයා විසින් ඉහත කී වගන්තියේ විධිවිධාන වලට යටත්ව එම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ හැකි බවත්; සහ

(iii) ආරක්ෂක ප්‍රදේශය ඇතුළත වූ භෞතික සැලසුම් සම්පාදනය සහ සංවර්ධනයට අදාළ, අධිකාරියේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය. මෙහි II වන උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති කටයුතු වලට සීමා විය යුතු අතර එම බලතල, කාර්ය හෝ කර්තව්‍ය, මෙහි II වන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ යුතු බවත්,

ප්‍රකාශයට පත් කරමි.

මේ නියමයේ -

‘‘පනත’’ යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අදහස් වේ; සහ

‘‘අධිකාරිය’’ යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති.

2024 ක් වූ ජුනි මස 05 වැනි දින,
කොළඹ දී ය.

**I වන උපලේඛනය**

***ආරක්ෂක ප්‍රදේශයේ ඉම් සලකුණු හා සීමා සහ සිතියම***

1. ආරක්ෂක ප්‍රදේශයේ භූමි ප්‍රමාණය හෙක්ටයාර 502.69 වේ.

2. එම ආරක්ෂක ප්‍රදේශය සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඩවිකන්ද ග්‍රාම නිලධාරි වසම සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගල ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටා ඇත.

3. ආරක්ෂක ප්‍රදේශයේ ඉම් සලකුණු සහ මායිම් පහත දැක්වෙන පරිදි වේ:-

*උතුර* - සමනල ස්වභාව රක්ෂිතය

*නැගෙනහිර* - සමනල ස්වභාව රක්ෂිතය

*දකුණ* - සමනල ස්වභාව රක්ෂිතය සහ සමනල ස්වභාව රක්ෂිතයේ මායිම අඩවිකන්ද ග්‍රාම නිලධාරී වසමේ මායිම හමුවන ස්ථානය දක්වා සහ අඩවිකන්ද ග්‍රාම නිලධාරී වසමේ මායිම දිගේ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (GPS) සඳහන් ඛණ්ඩාංක නැ.162599.9. උ.179278.2 දරන ස්ථානය දක්වා

*බටහිර* - ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (GPS) සඳහන් ඛණ්ඩාංක නැ.162599.9 උ.179278.2 දරන ස්ථානයේ සිට ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (GPS) සඳහන් ඛණ්ඩාංක නැ.162468.9, උ.179291.3, නැ.162554.3, උ.179382.7, නැ.162670.7, උ.179444.8, නැ.162723.6, උ.179438.2, නැ.162603.3, උ.179514.9, නැ.162560.9, උ.179517.6, නැ.162531.8, උ.179495.1, නැ.162431.3, උ.179426.3, නැ.162350.9. උ.179466.4, නැ.162369.7, උ.179552.6, නැ.162425.1, උ.179586.2, නැ.162413.4, උ.179675.0, නැ.162399.7, උ.179836.7, නැ.162412.3, උ.179943.9, නැ.162366.0, උ.180018.6, නැ.162394.2, උ.180131.9, නැ.162425.9, උ.180191.2, නැ.162383.6, උ.180296.8, නැ.162330.3, උ.180350.4, නැ.162293.0, උ.180412.3, නැ.162198.8, උ.180403.3, නැ.162075.7, උ.180446.9, නැ.161980.6, උ.180508.8, නැ.161978.0, උ.180586.4, නැ.162046.3, උ.180648.3, නැ.162152.6, උ.180612.6, නැ.162173.3, උ.180716.5, නැ.162280.8, උ.180725.9, නැ.162335.5, උ.180611.6, නැ.162345.1, උ.180428.2, නැ.162436.3, උ.180494.9, නැ.162411.7, උ.180588.6, නැ.162421.3, උ.180643.3, නැ.162394.6, උ.180747.3, නැ.162452.9, උ.180832.9, නැ.162460.5, උ.180921.2, නැ.162585.4, උ.181036.5, නැ.162699.7, උ.181120.6, නැ.162902.1, උ.181149.0, නැ.163090.3, උ.181192.9, නැ.163224.0, උ.181279.0, නැ.163159.4, උ.181408.0, නැ.163090.0, උ.181537.0, නැ.163080.5, උ.181627.1, නැ.162924.9, උ.181719.2, නැ.162775.7, උ.181762.0, නැ.162685.3, උ.181828.3, නැ.162559.6, උ.181923.7, නැ.162369.1, උ.181945.2, නැ.162251.2, උ.182047.4, නැ.161022.2, උ.181881.4, නැ.162081.1, උ.182007.1, නැ.161957.6, උ.181991.6, නැ.161799.3, උ.181902.0, නැ.161591.9, උ.181927.4, නැ.161410.3, උ.181854.0, නැ.161213.0, උ.181868.2, නැ.161119.6, උ.181789.3, නැ.161084.7, උ.181859.2, නැ.161044.4, උ.182006.3, නැ.160855.0, උ.181940.7, නැ.160717.4, උ.181940.7, නැ.160645.4, උ.182074.0, නැ.160788.9, උ.182145.3, නැ.160926.1, උ.182324.6,

දිගේ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (GPS) සඳහන් ඛණ්ඩාංක නැ.161101.0, උ.182472.5 දරන ස්ථානය දක්වා


4. බලයලත් මිනින්දෝරු චන්ද්‍රසිරි ජී. පුංචිහේවා විසින් 2007.04.06 වන දින සිට 08 වන දින දක්වා මැන සකස් කරන ලද අංක 1144 දරන මිනින්දෝරු පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන හෙක්ටයාර 4.2577 කින් යුත් ඉඩම් ප්‍රමාණය ආරක්ෂක ප්‍රදේශයෙන් බැහැර කරනු ලබන අතර එහි සීමා පහත පරිදි වේ

*උතුරින්* - අංක 393 දරන අවසාන ගම් පිඹුරේ ලොට් 361 2/3 හි කොටස;


*නැගෙනහිරින්* - අංක 393 දරන අවසාන ගම් පිඹුරේ ලොට් 361 2/3 හි කොටස;

*දකුණින්* - කළු ගඟ (කුරු ගඟ); සහ

*බටහිරින්* - අංක 393 දරන අවසාන ගම් පිඹුරේ ලොට් 357 සහ ලොට් 361 2/3 හි කොටස;


C. G. Punchihewa
Licensed Surveyor Leveller and
Court Commissioner,
Hidellena
Ratnapura
077 6047248
PLAN NO:1144
L.R.C.letter No,
dated 2006-11-15
Part of Lot 361 2/3 In
F.V.P. 393
Lot 199 In
F.V.P. 393
Old Road
New Road
To Idamspeek
Waranagala
Ambalama
From Kuruvita
Lot 57 In
F.V.P. 393
Part of Lot 361 2/3 In
F.V.P. 393
Part of Lot 361 2/3 In
F.V.P. 393
Lot 1
A R P
10 2 03.00
Province - Sabaragamuwa
Name of Land : Waranagala Walla
( Part of Lot 361 2/3 In
F.V.P. 393 )
Kalu Ganga
BS - Boundary Stone
WF - Wire Fence
B - Bank
Scale 1: 2000
Lot
Containing in Extent
A R P Hectare
1 10 2 03.00 4.2577
North
Part of Lot 361 2/3 In F.V.P. 393
East
Part of Lot 361 2/3 In F.V.P. 393
South
Kalu Ganga
West
Lot 357 - & Part of Lot 361 2/3 In F.V.P. 393
Remaks
Part of Lot 361 2/3 In F.V.P. 393
10 2 03.00 4.2577
Lot A. R. P. Hectares
1 10 2 03.00 4.2577
Surveyed on 2007/04/6-8
Boundaries Pointed Out By } Mr. K.P.B.M. Pathirana
Boundaries Pointed Out To } Derector L.R.C. Ratnapura
Drawn By Computer FB No. 48/54
Copy
Chandrasiri G. Punchihewa
Licensed Surveyor Leveller and
Court Commissioner

5. ආරක්ෂක ප්‍රදේශයේ සිතියම



## II වන උපලේඛනය

### *I වන කොටස*

*ආරක්ෂක ප්‍රදේශය ඇතුළත අවසරලක් කටයුතු*

**ආරක්ෂක ප්‍රදේශය ඇතුළත වූ භෞතික සැලසුම් සම්පාදනය සහ සංවර්ධනය පහත දැක්වෙන කටයුතු සඳහා පමණක් විය යුතුය:-**

1. දැනට පවතින යටිතල පහසුකම් සහ ගොඩනැගිලිවල නඩත්තු කටයුතු (ආගමික ස්ථාන දෙක, අම්බලම් දෙක, එරත්න - ශ්‍රී පාද මාර්ගය සහ වන්දනාකරුවන් සඳහා පහසුකම් සපයන මධ්‍යස්ථාන).

2. දැනට පවතින කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයේ ක්‍රියාකාරීත්වය සහ නඩත්තු කටයුතු.

3. ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ කළමනාකරණය කිරීම.

4. අධ්‍යාපනික හා පර්යේෂණ කටයුතු.

5. පුරාවිද්‍යාත්මක ස්ථානවල කැණීම්, සංරක්ෂණය සහ නඩත්තු කටයුතු.

6. සබරගමුව පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් යෝජනා කරන ලද වාහන නැවතුම්පොළ ඉදිකිරීම සහ නඩත්තු කටයුතු.

7. දැනට පවතින එරත්න සිට වර්ණගල කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය දක්වා වන මාර්ගයේ නඩත්තු කටයුතු.

8. පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ තිරසර පැවැත්මට අදාළ ක්‍රියාකාරකම්.

### II වන කොටස

**මේ උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති කටයුතු ආරක්ෂක ප්‍රදේශය තුළ සිදු කිරීමේ දී අදාළ කරගත යුතු කොන්දේසි**

1. මේ උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති යම් භෞතික සැලසුම් සම්පාදනය සහ සංවර්ධනය පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව සිදු කළ යුතු ය :-

(අ) එම භෞතික සැලසුම් සම්පාදනය සහ සංවර්ධනය පනතේ විධිවිධානවලට යටත්ව සිදුකරනු ලැබිය යුතු ය;

(ආ) එම අධ්‍යාපනික සහ පර්යේෂණ කටයුතුවල ප්‍රතිඵල, අධ්‍යයන හෝ පර්යේෂණ වාර්තාවේ පිටපතක් සමඟ අධිකාරිය වෙත භාරදෙනු ලැබිය යුතු ය;

(ඇ) එම භෞතික සැලසුම් සම්පාදනය සහ සංවර්ධනය -

(i) ආරක්ෂක ප්‍රදේශයේ තිරසාර පැවැත්මට බාධා නොවන ආකාරයෙන්; සහ

(ii) වනසත්ත්ව හා වෘක්ෂලතා වාසභූමිවලට හානි නොවන ආකාරයෙන්,

සිදු කළ යුතු ය;

(ඈ) ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ මෙම ආරක්ෂක ප්‍රදේශයට හඳුන්වා නොදිය යුතු ය;.

(ඉ) කිසිදු ආකාරයක අපද්‍රව්‍ය හෝ අපජලය ආරක්ෂක ප්‍රදේශයට බැහැර කරනු නොලැබිය යුතු ය;

(ඊ) ආරක්ෂක ප්‍රදේශය තුළ ඉඩම් ගොඩකිරීමේ කටයුතු, ඉඩම් හායනය සහ පාංශු බාදන සිදුවිය හැකි ක්‍රියාකාරකම් සිදු නොකළ යුතුය; සහ

(උ) දැනට පවතින කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ වේල්ලේ සිට කුරු ගඟේ පහළට ප්‍රමාණවත් පාරිසරික ජල ප්‍රවාහයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

2. 26 වන වගන්තියේ විධිවිධාන යටතේ පරිසර ආරක්ෂක ප්‍රදේශය තුළ යම් රජයේ දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක්, පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නිලධරයකු විසින් භෞතික සැලසුම් සම්පාදනය සහ සංවර්ධන කටයුතු සිදු කරනු ලබන අවස්ථාවකදී, එම භෞතික සැලසුම් සම්පාදනය සහ සංවර්ධනයට අදාළ ව්‍යාපෘති යෝජනා ඇගයීමේ ක්‍රියාවලිය සඳහා අධිකාරිය විසින් පරිපාලන ගාස්තු යෝජනා ක්‍රමයක් පිළියෙළ කර අනුගමනය කළ යුතු මෙන්ම එවැනි ක්‍රියාකාරකම් අධීක්ෂණය කරනු ලැබිය යුතු ය.

3. අධිකාරිය විසින් පනතේ 10 වන වගන්තියේ (ඒ) වන ඡේදයට යටත්ව, පරිසර ආරක්ෂක ප්‍රදේශය තුළ සැලසුම් සහ සංවර්ධන කටයුතුවලට අදාළ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී අධිකාරිය වෙත සහාය වීම පිණිස ''වර්ණගලවත්ත පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණ සහ අධික්ෂණ කමිටුව'' යනුවෙන් හඳුන්වනු ලබන කමිටුවක් පත් කරනු ලැබිය හැකි ය.

4. එම කමිටුව -

(අ) කමිටුවේ සභාපති විය යුතු කුරුවිට ප්‍රදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්වරයා;

(ආ) කමිටුවේ ලේකම් විය යුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කරනු ලැබිය යුතු අධිකාරියේ සහකාර අධ්‍යක්ෂවරයකු;

(ඇ) දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා;

(ඈ) කුරුවිට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා;

(ඉ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන එම දෙපාර්තමේන්තුවේ නිලධරයකු;

(ඊ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂක ජනරාල් විසින් නම් කරනු ලබන සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන එම දෙපාර්තමේන්තුවේ නිලධරයකු;

(උ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන එම දෙපාර්තමේන්තුවේ නිලධරයකු;

(ඌ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන එම කොමිෂන් සභාවේ නිලධරයකු;

(එ) ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන එම දෙපාර්තමේන්තුවේ නිලධරයකු; සහ

(ඒ) අධිකාරිය විසින් අවශ්‍ය යැයි නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් රජයේ ආයතනයක සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන එවැනි නිලධරයන්;

වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

EOG 06 -0041

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.